**උතුරු මැද පළාත් සභාව 2022**

**--------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උතුරු මැද පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 ජුලි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 20 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙටිකාලීන ආයෝජන ශේෂය රු. 1,798,423,885 ක් වුවත්, පළාත් භාණ්ඩාගාරයේ මුද්‍රිත සටහන අනුව එම ශේෂය රු.1,796,921,975 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන ශේෂයේ රු.1,501,910 ක නොසැසඳීමක් පැවතුණි. | 2021 වර්ෂය තුළ සිදුකරන ලද ආයෝජන වටිනාකම රු.1,501,910 ක් ශීර්ෂ අංක 661 ට ඇතුළත් නොවීමෙන් මෙම නොසැසඳීම සිදු වී ඇත.2023 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර අදාල ශීර්ෂයේ ආදායම් හා වියදම් භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොළී ලෙස රු.75,397,260 ක් දක්වා තිබුණද විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව එම අගය රු.140,185,976 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයට අදාල පොළී ආදායම රු.64,788,716 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. | 2023 වර්ෂයේදී ගැලපීම් කිරීමට කටයුතුකරනු ඇත. | පොළිය නිවැරදිව ගණනයකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන 06 සහ සටහන 07.1 අනුව මූලධන වැය විෂයන් තුනකට අදාලව වියදම රු.914,673,651 ක් වුවත් පළාත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තා අනුව එකී වියදම රු.807,076,616 ක් වූයෙන් රු.107,597,035 ක නොසැසඳීමක් විය. | අදාල අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙත නිවැරදි කර ගැනීම සඳහා දැනුම් දී ඇත. | පළාත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල අගයන් පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1 .5 මූලා ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 600- ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්<br>------------------------- | නිර්දේශය<br>------------------ |
|---|---|---|---|
| (අ) | ආණ්ඩුකාර කාර්යාලයට අයත් මෝටර් රථයක 2021 වර්ෂයේ සිදුවූ අනතුරට අදාල අලුත්වැඩියාවෙන් පසු වාහනය පණ ගැන්වීමට නොහැකි වීම නිසා නැවත පරික්ෂා කිරීමේදී විදුලි පද්ධතියේ දෝෂයක් ඇති බවත් එය අනතුර නිසා සිදුවී ඇති බවත් යාන්ත්‍රික ඉංජිනේරුවරයා නිගමනය කර තිබූ බැවින් ඊට අදාල අලාභහානි රක්ෂණ සමාගම මඟින් අයකරගත යුතු වුවද 2023 මාර්තු 20 දින දක්වාම රක්ෂණ වන්දි අයකර නොගැනීම හා අදාල විදුලි පද්ධතිය අලුත්වැඩියාව සිදුකර නොමැති වීමෙන් වාහනය භාවිතයට ගත නොහැකි වී ඇත.<br><br>එමෙන්ම අනතුර සම්බන්ධයෙන් අලභභානිය සම්පූර්ණයෙන්ම රක්ෂණ සමාගමෙන් අයකර ගැනීම හෝ රක්ෂණ සමාගම නොගෙවන කොටස රියදුරුගෙන් අයකර ගැනීම ඇතුළු මූ.රෙ. 104(4) අවසන් වාර්තාවේ ලබාදී තිබූ නිර්දේශද ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණ අවසන් වූ පසු අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා අයකර ගැනීම් සිදුකර ගැනීමට කටයුතු කරනු ඇත. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අදාල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ගරු පළාත් ආණ්ඩුකාරවරුන්ගේ පරිහරණය වෙනුවෙන් වෙන් කළ හැකි වාහන සංඛ්‍යාව තුනක් වුවත් උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයාගේ පරිහරණය සඳහා වාහන හතරක් වෙන්කර තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමා දැනුවත්කර වාහනය ආපසු ප්‍රධාන ලේකම් වෙත භාරදීමට කටයුතු කරනු ඇත. | උක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උතුරු මැද පළාත් සංවර්ධන සැලැස්මෙහි සඳහන් ව්‍යාපෘති සඳහා පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය යටතේ ප්‍රතිපාදන වෙන්කරනු ලබන අතර, ඒ යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව රු.මිලියන 260 ක නව ව්‍යාපෘති 161 ක් ක්‍රියාත්මක කර තිබූ නමුත්, එකී ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක හා ව්‍යාපෘතිවල කාර්යය සාධන දර්ශක සකස්කර නොතිබුණි. | ආණ්ඩුකාර කාර්යාලය විසින් ප්‍රතිපාදන ලබාදෙන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන වෙත අදාළ නිර්ණායක සැකසීමට උපදෙස් දී ඇත. | ප්‍රතිලාභීන් තොරා ගැනීම සඳහා නිර්ණායකද, ව්‍යාපෘතිවල ප්‍රගතිය පරික්ෂා කිරීම සඳහා කාර්යය සාධන දර්ශකද සකස් කල යුතුය. |
| (ඈ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර අත්‍යාවශ්‍ය නොවන වියදම් ලෙස කල් තැබිය යුතු වියදම් හඳුනාගෙන ඒවා අත් හිටුවීමට හෝ කල් තැබීමට කටයුතු කළ යුතු වුවද, මුදල් කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා අනුමත කර තිබූ සංවර්ධන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු ආගමික ස්ථාන වැඩි දියුණු කිරීමට අදාල රු.7,214,950 ක් වූ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණි. | මෙම ව්‍යාපෘති පළාත් සභා ආදායම් වලින් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. | අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය 610 - ප්‍රධාන අමාත්‍ය හා උතුරුමැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන,ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක,අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් තෝරා ගත් පාසල් 12 ක සූර්ය බල විදුලි පද්ධති ස්ථාපිත කිරීම සඳහා එකතුව රු.10,002,680 ක මුදලක් 2020 වර්ෂයේ දී වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද පරික්ෂාවේදී පාසල් දෙකක මාස 06 සිට මාස 13 දක්වා කාල පරාසයක එම පද්ධතියෙන් විදුලිය ජනනය වී නොතිබීම, විදුලි බිල්පත් මාසිකව නොලැබීම, මුළු පාසලේම විදුලි බිල ආවරණය කර ගැනීමට සැලසුම් කර තිබුණු නමුත්, එම පාසල්වල වෙනත් විදුලි මීටර් හරහා විදුලිය භාවිතා කර තිබීම සහ මේ සම්බන්ධයෙන් අධීක්ෂණ හා පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් එකී ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණ ඉටුව නොතිබුණි.. | මීට අදාල අධීක්ෂණ ක්‍රියාවලිය දුර්වල බැවින් නැවත විදුහල්පතිවරුන් හා පුහුණුවලත් ගුරුභවතුන් මඟින් අධීක්ෂණය කර වාර්ථා ලබාගෙන පද්ධති යතාවත් කිරීමට උපදෙස් දී ඇත. | පද්ධතිය යථාවත්කර ප්‍රමාණවත් විදුලියක් උත්පාදනයකර ගැනීමට හා අධීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ආ) | තිරප්පනේ මහානාම විද්‍යාලයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ලක් හා ප්‍රාථමික ඉගැනුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා 2017 මාර්තු 13 දින රු. 41,451,987 කට ගිවිසුම්ගත ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරු වැඩබිමේ ස්ථාපිත වූ බවට අධීක්ෂක ඉංජිනේරුවරයාගේ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව රු. 14,508,196 (වැට් සහිත) ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ කිරීමකින් තොරව එකී ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. එහෙත් මේ සඳහා කොන්ත්‍රාත්කරු ගෙන් ලබාගෙන තිබූ රු.12,435,596 ක් වූ අත්තිකාරම් ඇපකරය හා රු.2,072,600 ක් වූ කාර්ය සාධන ඇපකරය අදාල කාලය අවසන් වීමට පෙර මුදල් බවට පත්කරගෙන නොතිබුණි.එමෙන්ම මෙම ඉදිකිරීම්වලට ඉඩ ලබාගැනීම සඳහා භාවිතයේ පැවති “80x20” ප්‍රමාණයේ පාසල් ගොඩනැගිල්ලක්ද කඩා ඉවත්කර තිබුණි. | ඉංජිනේරුවරුන්ගේ සහ කාර්මික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතව ඇත. | ඉටු නොකළ වැඩ සඳහා ගෙවූ අත්තිකාරම් කඩිනමින් අයකර ගැනීමට හා අදාල ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩා ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීම සඳහා රු. 4,542,277 කට 2017 වර්ෂයේදී ගිවිසුම්ගත ව්‍යාපෘතිය රු.1,086,085 ක කල වැඩ වටිනාකමකින් අනතුරුව ඉදි කිරීම් අතහැර දමා තිබුණි | ඉංජිනේරුවරුන්ගේ සහ කාර්මික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතව ඇත. | අදාල ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහිත භූමිය වැඩිදියුණු කිරීම සඳහා රු. 5,061,771 ක වටිනාකමකට 2017 මැයි 15 දින ගිවිසුම්ගතව තිබූ කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා පස් සහ බොරළු සපයා ඒ සඳහා අධීක්ෂණ ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.7,124,767 ක් ගෙවීම් කර තිබුණි. එමෙන්ම ගිවිසුම්ගත පරිදි බොරළු අතුරා ක්‍රීඩා පිටිය නිම කර ද නොතිබුණි. | ඉංජිනේරුවරුන්ගේ සහ කාර්මික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතව ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ පදවිය මහසෙන් මහා විද්‍යාලය, පදවිය මහසෙන් ප්‍රාථමික විද්‍යාලය සහ පදවි පරාක්‍රමපුර ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල රු.65,680,724 ක ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් 2016 ඔක්තෝබර් 02 සිට 2017 පෙබරවාරි 12 දක්වා කාලය තුළ නිම කිරීම සඳහා ගිවිසුම්ගතව තිබුණ ද එම කොන්ත්‍රාත්තු නිම නොකර අතහැර දමා තිබූ අතර, ඒ වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.14,304,115 ක් විය. | කොන්ත්‍රාත්කරුවන් වැඩ අවසන් නොකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර සුහද එකඟතාවයෙන් කොන්ත්‍රාත් ගිවිසුම් අවසන් කර යලි ඇස්තමේන්තු කර ඉදිරියේදී අදාල කාර්යයන් නිම කිරීමට සැලසුම් කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කරමින් පවතී. | අදාල ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | පළාත් මුල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන සටහන 01 ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේදී ලබාදී තිබූ එහෙත් මෙතෙක් නිරවුල් නොකල අග්‍රිම ශේෂය රු. 26,405,861 ක් විය. | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණ සිදු කරන බැවින් අදාල අත්තිකාරම් මුදල පියවීමට නොහැකි බව දන්වා ඇත. | පළාත් මුල්‍ය රීති ප්‍රකාරව කටයුතුකර අග්‍රිමය නිරවුල් කළ යුතුය. |

### 1.5.3 උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

| | විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒජන්සියේ කාර්යය මණ්ඩලයට අයත් ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක සේවකයන් 06 දෙනෙකු එජන්සියෙන් බැහැරව පළාත් දෙපාර්තමේන්තුවලට අනුයුක්තව සිටින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව එකී සේවකයන් සඳහා එජන්සිය විසින් දරා ඇති වැටුප් හා දීමනා වියදම රු.3,296,908 ක් විය. | වරින්වර ප්‍රධාන අමාත්‍යාංශ විසින් කරන ලද ඉල්ලීම් අනුව නිදහස්කර ඇත. | වෙනත් ආයතනවලට මුදාහල ඒජනිසියේ සේවකයින් ඒජන්සියේ රාජකාරි සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඒජන්සියේ වාහන අළුත්වැඩියා අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.22,702,451 ක අමතර කොටස් මිලදී ගෙන තිබූ අතර එම අමතර කොටස් මිල දී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ආයතනයට ගැලපෙන ක්‍රමවේදයක් කඩිනමින් සකස්කර අනුමැතියට යොමු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අමතර කොටස් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 ශීර්ෂය 611 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------------ |
| (අ) | පළාත් පාලන ආයතනවල වැඩ තහනම් වී වසර 01 සිට වසර 07 දක්වා කාලයක් ගතවී ඇති නිලධාරීන් 08 දෙනකුගේ මූලික විමර්ෂන සහ විනය පරීක්ෂණ කටයුතු අවසන්කර නොතිබුණි. | විමර්ශන කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | අදාල විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කල යුතුව ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව තනි ලංසුවක් මත පදනම්ව රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙතින් රු. 8,420,602 ක වටිනාකමැති කාර්යාල උපකරණ හා පරිගණක උපාංග මිලදීගෙන තිබුණි. මෙහිදී එම භාණ්ඩවල මිල වෙළඳ පොළ මිල ගණන් හා සැසඳීමේදී සියයට 100 සිට සියයට 154 ක ඉහළ අගයක් ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම් සිදුකිරීමේ ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අදියරෙන් අදියර පිළිපැදිය යුතු මාර්ගෝපදේශයන්ද අනුගමනයකර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව (මධ්‍යම රජය) නිකුත්කර ඇති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇත. | ප්‍රසම්පාද මාර්ගෝපදේශ අනුගමනය කිරීම සහ පලාත් සභා අරමුදලට වඩා අර්ථික වාසි ලැබෙන පරිදි මිලදී ගැනීම් සිදුකළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ඉක්මවා අය නොවී පවතින සේවක ණය 15 ක එකතුව රු.1,458,814 විය. | අදහස් දැක්වීම් සිදුකර නොමැත. | හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.5 ශීර්ෂය 612 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | 2018 මැයි 24 දිනැති අංක 07/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 10(i) උප වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් ලිපිගොනුව නිවැරදිව සකස් කර අදාල නිලධාරියා විශ්‍රාම ගන්වන දින හෝ ඊට පසු සතියක් ඇතුළත අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යැවීමට කටයුතු කළ යුතු වුවත්, උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුභවතුන් 88 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් | ප්‍රමාදයක් සිදුවී ඇති අතර ඉදිරියේදී ප්‍රමාදය අවමකර ගැනීමට කටයුතු කරනු ඇත. | 2018 මැයි 24 දිනැති අංක 07/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලිපිගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමුකිරීමට කටයුතුකර නොතිබුණි. | | |
| (ආ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල් 811න් 2022 වර්ෂයේ දී කොට්ඨාශ හා කලාප කාර්යාල මඟින් අධීක්ෂණය කර තිබුණු පාසල් ගණන 376 ක් පමණක් විය. අධීක්ෂණයට භාජනය කර තිබුණු පාසල් වලින්ද පාසල් 114 ක ගුණාත්මක දර්ශක අගය සියයට 60 ට වඩා අඩු සාමාන්‍ය කාර්ය සාධනය පහල මට්ටමක පැවතුණි. | පාසල් පැවැත්වූ දින ගණන අඩුවීම, අධ්‍යාපන කාර්යය මණ්ඩලය හිඟවීම වැනි හේතු මීට බලපා ඇති අතර ශිෂ්‍ය කාර්යය සාධනය ඉලක්ක කර ගත් මාර්ගෝපදේශ සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | 2014 දෙසැම්බර් 02 දිනැති අංක 31/2014 දරණපාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වූ ඇගයීම් චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජාතික මට්ටමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පවත්වනු ලබන අ.පො.ස (සා.පෙළ) සහ උසස් පෙළ විභාග ප්‍රතිඵල අනෙකුත් පළාත් සමඟ සැසඳීමේදී උතුරු මැද පළාත 09 වන ස්ථානය ගෙන තිබුණි. | 2016 සිට 2020 දක්වා ක්‍රමික වර්ධනයක් පවතී.2022 වර්ෂය ඉලක්ක කර සිදුකරන වැඩසටහන් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත. | ජාතික මට්ටමේ විභාගවල ප්‍රතිපල ඉහළ නැංවීම කටයුතු කළ යුතුය. |
| (ඈ) | කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශ 07 කට අයත් පාසල් 586 ක පවතින 1399 ක් වූ ගුරු හා විදුහල්පති නිල නිවාස වලින් වර්ග අඩි 810,471 ක් වූ නිල නිවාස 947 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ ද, වර්ග අඩි 146,976 ක් වූ නිල නිවාස 183 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේද පැවති අතර එම නිල නිවාසවලින් 908 ක් කිසිවකු පදිංචි නොවීම හේතුවෙන් අභාවිතව ද පැවතුණි. | වාර්ෂිකව අලුත්වැඩියා කටයුතු සඳහා ලබාදෙන ප්‍රතිපාදන සීමා සහිත වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇත. | අවශ්‍යතා හඳුනාගෙන නිල නිවාස අලුත්වැඩියාකර පදිංචිය සඳහා ලබා දිය යුතුය. |
| (ඉ) | 1985 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ කලාප අධ්‍යාපන කාර්යාල බලප්‍රදේශ 06 ක පාසල් 49 ක්, විවිධ හේතු මත වසා තිබුණු අතර එම පාසල්වල වර්ග අඩි 115,800 ක් වූ පාසල් ගොඩනැඟිලි 110 ක්ද, ගුරු නිවාස 21 ක් සහ විදුහල්පති නිවාස 01 ක් පැවති අතර වසා දමා තිබූ පාසල්වල භූමි ප්‍රමාණය අක්කර 122.75 ක් විය. | වසාදමන ලද පාසල් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විධිමත්ව භාරදීමට උපදෙස් දී ඇත. | ස්ථිරවම වසා දමන පාසල් ගොඩනැගිලි හා ඉඩම් රජයේ වෙනත් සංවර්ධන කටයුතුවලට යොදාගැනීමට හැකිවන පරිදි ප්‍රාදේශීය ලේකම් වෙත භාරදිය යුතුය. |
| (ඊ) | උතුරු මැද පළාත් පාසල්වලට අනුයුක්තව සිටි විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් 63 දෙනෙකු මාස 02 සිට වසර 32 ක් දක්වා කාල පරාසයක සිට වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර, එම මුදාහල ගුරුභවතුන්ගෙන් 61 දෙනෙකු සඳහා මුදාහල දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ නිලධාරීන් සේවයට වාර්තා කිරීම, | වැටුප් ප්‍රතිපූර්ණය කරන ලෙස අදාල ආයතන වෙතින් ඉල්ලීම්කර ඇත. | අදාල ගුරුවරුන් පාසල් වලට අනුයුක්ත කිරීමේදී හා වැටුප් ගෙවීමේදී ප්‍රමාණවත් සනාථ කිරීම් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැමිණීම හා පිටවීම, නිවාඩු ආදිය පිළිබඳ තොරතුරු හා මුදාහල ආයතන වලින් ලබාගත් දීමනා පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමකින් තොරව කලාප අධ්‍යාපන කාර්යාල විසින් එකී නිලධාරීන්ට අදාලව ගෙවා තිබූ වැටුප් හා දීමනාවල එකතුව රු.257,490,892 ක් විය. | | |
| (උ) | කලාප අධ්‍යාපන කාර්යාල වෙත විදුහල්පතිවරුන් විසින් ලබාදී තිබූ සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 04 ට අදාල සිව්මස් වාර්තා අනුව පාසල් 318 ක සංවර්ධන සමිති ගිණුම්වල රු.100,000 කට වඩා මුදල් පැවති අතර, එම පාසල් සංවර්ධන සමිති ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුදල්වල එකතු වටිනාකම රු. 153,191,866 ක් විය. ඒ පිළිබඳ කලාප අධ්‍යාපන කාර්යාල විසින් නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබුණු අතරම පාසල් 81 ක 2022 වර්ෂයේ අවසන් මාස 04 ට අදාල සිව්මස් වාර්තා කලාප කාර්යාල වෙත ලබාදී නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී මේ පිළිබඳ සාකච්ඡා කරන අතර කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට මේ පිළිබඳ පෞද්ගලිකවම අධීක්ෂණය කරන ලෙස දන්වා අත. | 2018 ජුනි 22 දිනැති හා 26/2018 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර මෙම මුදල් අදාල කාර්යය සඳහා භාවිත කළ යුතුය. |
| (ඌ) | නිලධරයෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු වුවත්, උතුරු මැද පළාත තුළ පිහිටි පාසැල් වල 1989 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ගුරු සේවයට පත්වීම් ලැබූ ගුරුභවතුන් 313 දෙනකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සේවය ස්ථිර කිරීමට අදාල කටයුතු අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉටුකරමින් පවතිනු ඇත. | අදාල ගුරුභවතුන් කඩිනමින් ස්ථිර කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | පාසල් 290 කට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අනුයුක්ත කර නොමැති වීම හේතුවෙන්, ගුරු සේවයට අයත් ගුරුවරුන්ට විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කිරීමට වැඩ බලන තනතුරු ලබා දී තිබුණු නමුත්, පාසල් 122 ක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නියෝජ්‍ය විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කරමින් පැවතුණි. | විදුහල්පති තනතුරුවල පැවති පුරප්පාඩු ආවරණය කිරීම සඳහා බඳවාගෙන ඇති අතර වසර 05 කට වඩා වැඩි කාලයක් සේවයේ යොදවා ඇති මෙම වැඩ බලන විදුහල්පතිවරු වෙනුවට ශ්‍රේණිධාරී විදුහල්පතිවරු යෙදවීම ගැටළුවක් වී ඇත. | ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සඳහා විදුහල්පති තනතුර ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කලාප අධ්‍යාපන කාර්යාල 07 ක පාසල් සඳහා අනුමත පාසල් කාර්ය සහායක , රසායනාගාර සහකාර සහ මුරකරු සංඛ්‍යාව පිළිවෙලින් 359 දෙනකු , 56 දෙනකු හා 270 දෙනකු වුවද, ඒ යටතේ සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිවෙලින් 219 දෙනකු 61 දෙනකු හා 136 දෙනකු විය. මෙම අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවා තිබූ සේවක වැටුප් හා දීමනා රු.239,800,292 ක් විය. | කලාප කාර්යාලවල කාර්ය මණ්ඩලය සංශෝධනය කරන ලෙස ඉල්ලා ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැත. | අනුමත සේවක සංඛ්‍යාව යලි සමාලෝචනය කර තනතුර සඳහා යලි අනුයුක්ත කළ යුතු අතර අතිරික්ත සේවකයින්ගේ පුරප්පාඩු පවතින වෙනත් ආයතන වෙත යොමු කළ යුතුය. |
| (ඔ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී එකක් රු.173,300 බැගින් පරිගණක 05ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකොට රු.866,500 කට මිලදීගෙන තිබුණි. මේ සඳහා ඇනවුම් කළ පරිගණක වල ධාරිතාවය (මධ්‍යම සැකසුම් ඒකකය - CPU) i5 වුවත් ලැබී තිබූ පරිගණකවල එම ධාරිතාවය i3 ප්‍රමාණයේ විය. එහෙත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලැබී තිබූ පරිගණකවල ධාරිතාවය i5 ලෙස වාර්තා කර තිබුණි. | සැපයුම් ආයතනය ලබාදුන් පරිගණකවල ධාරිතාව i3 ප්‍රමාණය බව පිළිගෙන ඇති අතර පරිගණක මාරුකර නියමිත ධාරිතාවයෙන් යුතු පරිගණක ලබාදීමට එකඟ වී ඇත. | අදාල සිද්ධියට සම්බන්ධ නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.6 ශීර්ෂය - 620 පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ----------------- |
| (අ) | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ඉක්මවා අය නොවී පවතින එක් සේවකයෙකුගේ ණය ශේෂය රු.104,665 ක් විය. | අදහස් දැක්වීම් සිදුකර නොමැත. | හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊලඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන 01 ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය නිරවුල් නොකල අග්‍රිම ශේෂය රු. 302,158 ක් විය. | මෙම ව්‍යාපෘතිය කරගෙන යාමේදී එවකට පැවති ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ව්‍යාපෘතිය නතර කර වෙනත් ස්ථානයකට මාරු කිරීම නිසා අදාළ කොන්ත්‍රාත්කරුට මෙම ව්‍යාපාතිය කරගෙන යාමට නොහැකි වී වැඩ අතහැර දමා ඇති බැවින් මෙම මුදල අයකර ගැනීමට නොහැකි වී ඇත. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර අග්‍රිමය නිරවුල් කළ යුතුය. |

### 1.5.7 ශීර්ෂය 621 - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ----------------- |
| (අ) | 2019 ජුනි මාසයේදී වැඩ අවසන් කර තිබූ පර්යේෂණාගාර ගොඩනැගිල්ල සඳහා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් රු.27,358,427 ක වියදමක් දරා තිබූ නමුත් අපේක්ෂිත පරිදි ප්‍රමාණවත් පර්යේෂණ කාර්යයන් සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | පර්යේෂණාගාරයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු කළ ද මිලදී ගැනීම් අත්හිටුවීම හේතුවෙන් භාවිතා කළ නොහැකි වී ඇත. | අදාල උපකරණ මිලදී ගෙන පර්යේෂණාගාරය කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ඉක්මවා අය නොවී පවතින සේවක ණය ශේෂ එකතුව රු.194,958 ක් විය. | කරුණු පැහැදිලි කිරීම් සිදුකර නොමැත | හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.8 ශීර්ෂය 631- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ----------------- |
| (අ) | නාච්චාදූව සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය ඉදි කිරීම සඳහා රු.643,038,725 ක කොන්ත්‍රාත්තුවට අදාලව රු.12,660,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2021 වර්ෂයේදී ගෙවා තිබූ නමුත්, අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ අත්තිකාරම් මුදලින් තවදුරටත් අයකරගත යුතු මුදල රු.2,660,000 ක් විය. | මේ සම්බන්ධයෙන් බැංකුව සමඟ අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතින බැවින් ඉන්පසු කටයුතු කරනු ඇත. | අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 22 දින අනතුරට පත් පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා රු. 8,500,000 ක් ගෙවීම්කර තිබූ නමුත් පූර්ණ රක්ෂණ ආවරණයක් හිමි මෙම රථයට අදාල රක්ෂණ හිමිකම ලබාගෙන නොතිබුණි. | අදාල නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ආරම්භකර ඇත. | රක්ෂණ වන්දි අයකර ගැනීම හා විනය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ඇ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ඉක්මවා අය නොවී පවතින සේවක ණය 27ක එකතුව රු.2,987,320 ක් විය. | අදහස් දැක්වීම් සිදුකර නොමැත | හිඟ ණය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 632- පළාත් ආයුර්වේද දෙපාර්තමේනතුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| මින්නේරිය ආයුර්වේද රෝහලේ ශ්‍රී ලාංකිකයන්ට හා විදේශිකයන්ට සේවා සැපයීමේ අරමුණින් රු. 23,618,102 ක් වියදම් දරා 2017 ඔක්තෝබර් වන විට වැඩ අවසන් කර තිබූ මින්නේරිය පංචකර්ම ඒකකය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය උපකරණ ලබාගෙන කාර්ය මණ්ඩල අනුයුක්ත කළ වහාම ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. | අප්‍රමාදීව අරමුණුගත කාර්යය සඳහා යොදාගත යුතුය. |

**1.5.10 ශීර්ෂය - 640 පළාත් සමූපකාර,වෙළඳ හා ආහාර, ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියට ඇතුළු වී වංචනික ලෙස ඉකුත් වර්ෂයේ ආදායම් බලපත්‍ර, දුම් සහතික, රක්ෂණ සහතික නොමැතිව ආදායම් බලපත්‍ර නිකුත් කිරීම, නිකුත් කළ ආදායම් බලපත්‍රවලට අදාළ තොරතුරු මකා දැමීම, වෙනස් කිරීම, හිඟ ආදායම් මකා දැමීම යනාදිය මගින් වාහන ආදායම් බලපත්‍ර ආදායම් වංචා කිරීමේ හැකියාව පැවතුණි. එවැනි අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කිරීමට මෙම පද්ධතිය උතුරු මැද පළාත් මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවට සපයා ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අපොහොසත් වී තිබුණි. | ER -2 වැඩසටහන ක්‍රියාත්මක වූ පසු මෙම අඩුපාඩු නිවැරදි වනු ඇත | කඩිනමින් අඩුපාඩු නිවැරදිකර අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය. |

**1.5.11 උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------- | ------------------ |
| (අ) | අධිකාරියට සේවකයන් බඳවා ගැනීමට අදාල බඳවාගැනීම් පටිපාටි හා අභ්‍යන්තර විභාග පැවැත්වීමට අදාල විභාග පටිපාටි සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සකස්කර අනුමතකරගෙන නොතිබුණි. ඒ හේතුවෙන් විභාග පැවැත්වීමකින් තොරව වැටුප් වර්ධක ගෙවීම හා සේවය ස්ථිර කිරීම සිදුකර තිබුණි. | කළමනාකරණසේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීමේ කටයුතු සිදු කරනු ඇත. | බඳවාගැනීම් පටිපාටියක් ආදාල ආයතන වෙතින් අනුමතකරවාගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුරාධපුර නව බස් නැවතුම්පළ කඩ කාමර වෙනුවෙන් රු.5,934,350 ක්ද දූර සේවා බස් නැවතුම්පළ කඩ කාමර වෙනුවෙන් රු.656,512 ක් ද සහ කැකිරාව බස්නැවතුම්පළ කඩ කාමර වෙනුවෙන් රු. 2,422,991 ක් ද ලෙස රු.9,013,853 ක හිඟ කඩ කුලී ආදායමක් විය. | හිඟ අයකර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඇත. | හිඟ කඩකුලී කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | අධිකාරියට අයත් මැදවච්චිය බස් නැවතුම්පල පර්යන්තයේ බිම් කොටස් 08 ක් 2020 ජුනි මස 06 දින සිට වසර 20 ක කාලයක් සඳහා බදු දී තිබුණද එම බදුකරුවන් තෝරා ගැනීමේ පදනම සහ ඒ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. | බස්නැවතුම්පළ තුළ ගොඩනැගිලි ඉදි කිරීම පිළිබඳව කඩහිමියන්ගේ විරෝධතා හේතුවෙන් දැනට මෙම ඉදිකිරීම අත්හිටුවා ඇත. | ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කොට අධිකාරියට උපරිම ආදායමක් ලබාගත හැකිවන පරිදි කඩ කාමර බදු දීම සිදු කළ යුතුය. |

**1.5.12 උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | 2003 අංක 02 දරන උතුරු මැද පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තියේ 5 (ඇ) වගන්තිය අනුව පළාතේ සියළුම නව සහ දැනට පවත්වා ගෙන යනු ලබන කර්මාන්තකරුවන් අධිකාරියේ ලියාපදිංචි කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 104 දෙනෙකු ලියාපදිංචි කර තිබුණු අතර , පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිසිඳු කර්මාන්තකරුවෙකු ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් ලියාපදිංචිය සඳහා මැලිකමක් දක්වන අතර ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන මත ඉදිරි කටයුතු කරනු ඇත. | පළාතම ආවරණය වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උතුරු මැද පළාත් සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන සුළු පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පළාතේ ලියාපදිංචි කර්මාන්තකරුවන් 49 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ රු. 4,825,000 ක ණය ලබාදී තිබුණි. එයින් ණයලාභීන් 17 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවකට අනුව රු.100,000 බැගින් ණය ලබාගත් ණය ප්‍රතිලාභීන් 06 දෙනෙකුගේ ව්‍යාපාර 2023 ජනවාරි මාසය වන විට අක්‍රියව පැවති අතර තවත් ණයලාභීන් හතර දෙනෙකු ව්‍යාජ සහතික ඉදිරිපත් කර රු.375,000 ක ණය පහසුකම් ලබාගෙන තිබුණි. | නිශ්චිතව කරුණු පැහැදිලි කිරීම් සිදුකර නොමැත. | ප්‍රමාණවත් පරිදි තහවුරුකර ගැනීමකින් අනතුරුව ණය ලබාදීම සිදුකළ යුතු අතර අඛන්ඩව පසු විපරම් සිදුකළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 641- පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | 2012 වර්ෂයේදී දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව රු. මිලියන 190 ක් වැය කර ඉදිකරන ලද විලච්චිය විවිධ සේවා සමූපාකාර සමිතියේ සහල් සැකසුම් මධ්‍යස්ථානය අක්‍රියව තිබීම හේතුවෙන් එය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී රු.3,038,000 ක් වැය කර මිලදී ගත් යන්ත්‍රෝපකරණද සවිකිරිමට කටයුතු කර නොතිබුණු අතරම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර පවත්වා ගෙන යාමට බලයලත් නිලධාරියෙකු පත්කර නොමැති බැවින් එම ව්‍යාපෘතිය තවදුරටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | විලච්චිය විවිධ සේවා සමුපකාර සමිතිය විසින් තවදුරටත් මිලදී ගත යුතු උපකරන සඳහා ණය මුදලක් ඉල්ලා ඇති අතර ඒ අනුව ඉතිරි උපකරණ මිලදී ගත් පසු යන්ත්‍ර සවිකර කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත රු.1,072,840 ක් වියදම් දරා 2021 වර්ෂයේදී නවීකරණය කරන ලද දම්පැලැස්ස සමුපකාර ප්‍රාදේශිකයේ ගොඩනැඟිල්ල ඉදිකිරිම්වල පවතින දූර්වලතා නිසා ප්‍රයෝජනයට ගත නොහැකිව අතහැර දමා තිබුණි. | පෙන්වා ඇති අඩුපාඩු සමුපකාර සංගමය මගින් නිවැරදිකර ඉදිරියේදී ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමූපාකර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා වාර්ෂික සමූපකාර සමිති දායකය රු. 7,776,000 ක් සහ පළාත් සභා අරමුදලින් වාර්ෂිකව ලැබෙන රු.10,000,000 ක් සමඟ වාර්ෂික ලැබීම් රු.17,776,000 ක් විය. එහෙත් අරමුදලේ සේවක ප්‍රතිලාභීන් 560 ක් සඳහා වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වියදම රු. 25,691,016 ක් වන බැවින් අරමුදලේ ඉදිරි පැවැත්ම අවිනිශ්චිත විය. එමෙන්ම 2021 සහ 2022 වර්ෂයන්ට අදාලව ප්‍රතිලාභීන් සඳහා විශ්‍රාම වැටුප් ලෙස තව දුරටත් ගෙවිය යුතු මුදල රු.17,791,403 ක් විය. | අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල සමූපකාර නියෝජිතයන් සමඟ සාකච්ඡා පවත්වමින් සිටින අතර සමූපකාර සමිතිවලින් ලැබෙන ප්‍රතිචාර අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | සමූපාකර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යලි සමාලෝචනය කර වාර්ෂිකව ප්‍රතිලාභ ගෙවිය හැකිවන පරිදි අරමුදල් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2009 අංක 05 දරන සමූපකාර ප්‍රඥප්තියේ 58(2) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කළ සමූපකාර සමිතියක් සම්බන්ධයෙන් වන තීරක ආරවුල් නිරවුල් කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් ඔහු විසින් කටයුතු කළ යුතු වුවද, 1997 සිට 2020 කාලය තුළ උතුරු මැද පළාත් සමූපකාර කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් වෙත ලැබී තිබූ අභියාචනා 31 ක් සම්බන්ධයෙන් වූ කටයුතු අවසන් කර නොතිබුණි. මෙම අභියාචනා සම්බන්ධයෙන් අභියාචනාකරුවන් විසින් පළාත් සමූපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති මුදල රු.1,113,342 ක් විය. | 2021 වර්ෂය දක්වා පැවති ප්‍රමාද ලිපිගොනු අතරින් ප්‍රමානවත් ලිපිගොනු ප්‍රමාණයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අවසන්කර ඇති අතර ඉතිරි ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු සිදුකරමින් පවතී | 2009 අංක 05 දරන සමූපකාර ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත සමූපාකාර සමිතිවල මූලා ප්‍රකාශන විගණනය සඳහා සමූපකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි සමූපකාර සමිති 05 ක ගිණුම් 33 ක් නියමිත කාලවකවානු තුළ විගණනය සඳහා සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රමාද කාලය වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක විය. එමෙන්ම වර්ෂ 2013 සිට 2021 කාලය තුල ලැබී තිබුණු සමිති 09 කට අයත් ගිණුම් 29 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා විගණනය කර නොතිබුණි. | ප්‍රමාණවත් කරුණු පැහැදිලි කිරීමක් සිදුකර නොමැත. | ගිණුම් නියමිත දිනට පෙර ගෙන්වාගෙන කාලීනව විගණනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ඉක්මවා අය නොවී පවතින සේවක ණය ශේෂ 2 ක එකතුව රු. 137,899 විය. | කරුණු පැහැදිලි කිරීම් සිදුකර නොමැත. | අත්තිකාරම් ගිණුම්වල හිඟ ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 642- පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------------ |
| පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව සතු කඩ කාමර විධිමත් ගිවිසුමක් නොමැතිව කුලියට දීමෙන් 2022 අගෝස්තු 30 දිනට පුද්ගලයන් 34 කගෙන් අයවිය යුතු කඩ කුලී හා දඩ මුදල් රු.1,914,365 ක් විය. ඉන් රු.549,900 ක් 2019 අප්‍රේල් මාසයට පෙර සිට පැවත එන ශේෂයක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 30 දිනට තහඩු කඩ කාමර 09 කින් රු.437,950 ක මුදලක් අය විය යුතුව පැවති අතර එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කඩ හිමියන් ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනාවක් ඉදිරිපත් කර ඇති අතර, එකී තීරණය මත අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | විධිමත් ගිවිසුමකට එළඹීම හා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 650 - පළාත් ඉඩම්,වාරි මාර්ග, මහා මාර්ග,නිවාස, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------------ |
| පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊලඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන 01 ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට පළාත් වාරි මාර්ග අමාත්‍යාංශය විසින් 2007 වර්ෂයේදී ලබාදී තිබූ එහෙත් මෙතෙක් නිරවුල් නොකල අග්‍රිම ශේෂය රු. 302,158 ක් විය. | ඒරියාගම වඩු පුහුණු පාසලේ නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු.302,158 ක නොපියවූ අත්තිකාරම් මුදලක් වන බවත් එතැන් පටන් වරින්වර අමාත්‍යාංශවල විෂය පථය වෙනස්වීම මත මෙම මුදල අයකර ගැනීමට නොහැකි වී ඇත. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර අග්‍රිම ශේෂ නිරවුල් කළ යුතුය. |

### 1.5.16 පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලැස්මට ඇතුළත් වූ මාර්ග නඩත්තු සඳහා මිල දී ගැනීමට සැලසුම් කළ රු. මිලියන 61.97 ක ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදුකර නොතිබුණු අතර, අධිකාරියේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය මඟින් ඉටු කිරීමට ඇස්තමේන්තුකර තිබූ රු. මිලියන 17.32 ක මාර්ග නඩත්තු වැඩ 11 ක් ද අත්හැර දමා තිබුණි. | රටතුළ පැවති අස්ථාවර තත්ත්වය හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි වී ඇත. | සංවර්ධන සැලැස්ම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් ඉඩම්,වාරිමාර්ග, මහාමාර්ග,නිවාස, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ ලද ප්‍රතිපාදන මත මාර්ග නඩත්තු කටයුතු සඳහා මිල දී ගෙන තිබූ රු. 180,082 ක බොරළු සහ රු. 983,823 ක තාර යොදාගෙන සමාලෝචිත වර්ෂයේදී මාර්ග පුනරුත්තාපන ව්‍යාපෘති සිදුකර එම වටිනාකම නැවත අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා ඇත. | අරමුදල් භාවිතයේදී නිසි අධීක්ෂණයක් පවත්වාගත යුතු අතර වැඩිපුර අයකරගත් මුදල් නිවැරදි කළ යුතුය. |

### 1.5.17 ශීර්ෂය 652 පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------------ |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙ ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත අංක 2002 - 01- 03 ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු යටතේ හිඟ ශේෂය රු.313,416,505 ක් විය. | මේ පිළිබඳව ප්‍රධාන ලේකම්ගේ 2022-10-04 දිනැති වාර්තා පදනමකරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.18 ශීර්ෂය 653- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------------ |
| සමාලෝචිත වර්ෂය අවසන්වන විට ග්‍රාම සංවර්ධන අරමුදල පිහිටුවා වර්ෂ 10 ක් පමණ කාලයක් ගතව ඇතත්, අරමුදලේ රීති සකස් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ බැංකු ගිණුමේ වූ රු.1,875,906 ක මුදල එකී පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදවා ගත නොහැකිව නිශ්කාර්යව පැවතුණි. | ස්ථාවර තැන්පත්වලට යොමුකිරීමට ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති අතර අරමුදල සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ඉහළ කළමනාකරණ කමිටුවක් පත් කර ඇත. | පළාත් සභා පිහිටවූ පසුඅදාල පාර්ශවයන් ලවා රීති සකස්කර අනුමත කරවාගත යුතුය. |

### 1.5.19 ශීර්ෂය - 660 ප්‍රධාන ලේකම් කාර්යාලය

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------------ |
| (අ) | ප්‍රධාන ලේකම් රැස් කරන ලද මුද්දර ගාස්තු හා උසාවි දඩ යටතේ අදාල පළාත් පාලන ආයතනවලට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තව දුරටත් ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.126,989,584 ක් හා රු.41,580,673 ක් විය. | පලාත් පාළන ආයතන වලින් ලැබෙන ඉල්ලීම් අනුව මෙම ගාස්තු නිදහස් කරනු ඇත. | පලාත් පාළන ආයතන වෙත හිමි ආදායම් එම ආයතන වෙත නිදහස් කළ යුතුය. |
| (ආ) | කොරකහවැව කළමනාකරණ පුහුණු ඒකකය ඉදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන්වන විට රු. 182,921,248 ක් වැය කර තිබුණද, අපේක්ෂිත නිමැවුම් මට්ටමට ලඟා නොවීම, අවශ්‍ය පුහුණු ධාරිතාවයට වඩා වැඩි ධාරිතාවයකින් යුත් ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම් කර කොටස් වශයෙන් ඉදි කර තිබීම, පළාත් සභා සහ දෙපාර්තමේන්තු සඳහා වෙනමම පුහුණු මධ්‍යස්ථාන පැවතීම වැනි හේතු නිසා මෙම පුහුණු මධ්‍යස්ථානය ඌන උපයෝජිතව පැවතුණි. | ගාස්තු අයකිරීම මත විවිධ උත්සව හා ප්‍රසංග සඳහා ලබාදී ඇති අතර මෙම ගොඩනැගිල්ලේ කොටසක් විදේශගත වන ශ්‍රමිකයින් පුහුණු කරන ආයතනයක් වෙත කුලී පදනම මත ලබා දීමට සාකච්ඡා කරමින් පවතී | පුහුණු ඒකකය ඵලදායි ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය**.** |
| (ඇ) | උතුරු මැද පළාත් සභාව සතු භාවිතයෙන් ඉවත්කර ඇති අපහරණ තත්ත්වයේ පවතින වාහන 80 ක් වෙන්දේසි කර විකිණීම සඳහා 2022 වර්ෂයේ ජනවාරි මස ප්‍රධාන ලේකම් පත් කරන ලද කමිටුවක් විසින් තීරණය කර තිබූ නමුත් එකී කාර්යයන් 2023 මාර්තු 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | හඳුනාගත් වාහන කඩිනමින් වෙන්දේසි කිරීමට කටයුතු කරමින් පවතී | අපහරණ කටයුතු කඩිනමින් සිදුකර අවසන් කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රධාන ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ගෙ අත්තිකාරම් ගිනුමේ 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ඉක්මවා අය නොවී පවතින සේවක ණය 08 ක එකතුව රු.1,855,552 ක් විය. | අදහස් දැක්වීම් සිදුකර නොමැත. | අත්තිකාරම් ගිණුම්වල පවතින හිඟ ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | හදිසි අවස්ථා අරමුදලෙහි 2010 වර්ෂය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස රු.13,000,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනතුරු රු. 1,205,684 සිට රු.13,594,474 ක පරාසයක මුදලක් ඉතිරිකිරීමේ ගිණුමක පැවතුණි. | විගණනය විසින් පන්වා දෙනු ලබන නිරීක්ෂණ හා එකඟවන අතර ඉදිරියේදී එවැනි තත්ත්වයක් නොවීමට සටහන්කර ගන්නා ලදි. | අරමුදල් ගිණුම්වල පවතින ශේෂයන් වඩාත් ඵලදායී ලෙස ආයෝජනවල යෙදවිය යුතුය. |

**1.5.20 ශීර්ෂය - 661 පළාත් භාණ්ඩාගාරය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------- | ------------------ |
| පළාත් සභා අරමුදලින් රු.1,798,423,885 ක් කල්පිරු පසු ස්වයංක්‍රීයව අලුත්වන ආකාරයට කෙටිකාලීන ආයෝජනවල යොදවා තිබූ අතර එම තැන්පතු එක් එක් කාලච්ඡේදය සඳහා රාජ්‍ය වාණිජ බැංකුවල තරඟකාරී මිල ගණන් මත වඩා ඵලදායි ආයෝජනයන්හි යෙදවීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | පළාත් සභා අරමුදලට අදාල ගිණුම් පවතින රාජ්‍ය බැංකු දෙකක මෙම මුදල් ආයෝජනය කර ඇත. | තරඟකාරී පොළී අනුපාත මත වඩා ඵලදායි ආයෝජන කෙරෙහි යොමු විය යුතුය. |